MINISTRY OF EDUCATION

අධ්‍යාපන අමාත්‍යාංශය

G.C.E. ORDINARY LEVEL - Rehearsal Paper

අ.පො.ස. (සා / පෙළ ) - පෙරහුරු ප්‍රශ්න පත්‍ර

ENTREPRENEURSHIP STUDIES

ව්‍යවසායකත්ව අධ්‍යයනය

# ANSWER PAPER - II

# පිළිතුරු පත්‍රය - II




අනුග්‍රහය :

ICT BRANCH Ministry of Education Sri Lanka
NenasaTV
e තක්සලාව
The National e-learning Portal for The General Education

# අධ්‍යාපන අමාත්‍යාංශය

## ව්‍යවසායකත්ව අධ්‍යයනය - II

## අ.පො.ස. (සා/ පෙළ) - අපේක්ෂිත පිළිතුරු පත්‍රය

**11 ශ්‍රේණිය** **කාලය - පැය 3 යි**

01.

i. කේවල ස්වාමි ව්‍යාපාරයකි / ඒක පුද්ගල ව්‍යාපාරයකි.

ii. ලියාපදිංචිය අනිවාර්යවේ.

හේතුව -

කේවල ස්වාමි ව්‍යාපාරයක් එහි අයිතිකරුගේ සම්පූර්ණ නමින් හැර වෙනත් ව්‍යාජ නමකින් පවත්වාගෙන යන විට 1918 ව්‍යාපාර නාම ආඥා පනත යටතේ ලියාපදිංචි කළ යුතුය.

iii. ශක්තීන්

කාබනික පොහොර භාවිතයෙන් එළවළු හා ධාන්‍ය වගා කිරීම.

හර්ෂණ ද සිල්වා දේශීය වෛද්‍ය විද්‍යාලයේ පෝෂණවේදී උපාධිධාරියකු වීම.

අවස්ථා

ජාතික රෝහල ආසන්නයේ වෙළඳසැල් ස්ථානගත කිරීම.

ස්වාභාවික ආහාර පාන සපයා ලබාගත් ඉහල කීර්තිනාමය.

iv.

| | |
|---|---|
| අයිතිකරු ආයෝජනය කළ මුදල | රු: 500,000 |
| මහජන බැංකුවෙන් ලද ණය මුදල | රු: 300,000 |
| ආරම්භක වත්කම | රු: 800,000 |

v. වාසි -

- ලාභය තනිව භුක්ති විඳිය හැකි වීම.
- ස්වාධීනව තීරණ ගත හැකි වීම.
- පහසුවෙන් ආරම්භ කල හැකි වීම.
- ව්‍යාපාරික රහස්‍යභාවය ආරක්ෂා වීම.
- නීතිමය බැඳීම් අවම වීම.

vi.

| | | (රු) |
|---|---|---|
| විකුණුම් | | 750,000 |
| අමුද්‍රව්‍ය පිරිවැය | 150,000 | |
| ශ්‍රම පිරිවැය | 180,000 | |
| වෙනත් නිෂ්පාදන පිරිවැය | 50,000 | |
| නිෂ්පාදන පිරිවැය | 380,000 | |
| පරිපාලන වියදම් | 120,000 | |
| විකුණුම් වියදම් | 60,000 | |
| ණය පොලී ගෙවීම් | 6,000 | (566,000) |
| ශුද්ධ ලාභය | | 184,000 |

vii.

| | |
|---|---|
| විකුණුම් | 750,000 |
| විකුණුම් වියදම | (60,000) |
| ශුද්ධ විකුණුම් ආදායම | 690,000 |

viii.

| | |
|---|---|
| අමුද්‍රව්‍ය පිරිවැය | 150,000 |
| ශ්‍රම පිරිවැය | 180,000 |
| වෙනත් නිෂ්පාදන පිරිවැය | 50,000 |
| මුළු නිෂ්පාදන පිරිවැය = | 380,000 |

ix. වාරිකය තුළ ඇතුළත් වූ වගකීම් කොටස = 40,000 - 6000
( වාරිකය - පොලිය ) = 34000

ණය වාරිකය තුළ ඇතුළත් වියදම = 6000
(පොලිය පමණි )

x. බැංකු ගිණුම

| | | | |
|---|---|---|---|
| ප්‍රාග්ධනය | 500,000 | අමුද්‍රව්‍ය පිරිවැය | 150,000 |
| බැංකු ණය | 300,000 | ශ්‍රම පිරිවැය | 180,000 |
| විකුණුම් | 750,000 | වෙනත් නිෂ්පාදන පිරිවැය | 50,000 |
| | | පරිපාලන වියදම් | 120,000 |
| | | ණය වාරික | 40,000 |
| | | විකුණුම් වියදම් | 60,000 |
| | | ශේෂය ප/ගෙ | 950,000 |
| | 1,550,000 | | 1,550,000 |
| ශේෂය ඉ/ගෙ | 950,000 | | |

02.

i.

- පහල කළමනාකරණය
- මධ්‍ය කළමනාකරණය
- ඉහල කළමනාකරණය

ii.

- සැලසුම්කරණය
- සංවිධානය
- මෙහෙයවීම
- පාලනය

iii.

- පොදු අරමුණක් පැවතීම.
- සීමිත සම්පත් භාවිතය.
- සංවිධාන ව්‍යුහයක් පැවතීම.
- ආර්ථික කටයුත්තක නියැලීම.
- පුද්ගල කණ්ඩායමක් ඒකරාශී වී සිටීම.

iv. ශක්තීන් -

- ඉහළ ප්‍රාග්ධන ශක්තිය.
- පුහුණු සේවකයින් සිටීම.
- නව තාක්ෂණය භාවිතා කිරීම.

දුර්වලතා -

- පහල ප්‍රාග්ධන ශක්තිය.
- නුපුහුණු සේවකයන් බහුලවීම.
- යල් පැනගිය තාක්ෂණික උපකරණ භාවිතය.

v.

| අවශ්‍යතා | | වුවමනා |
|---|---|---|
| ආහාර | → | බත්,පාන්,ඉඳි ආප්ප |
| ඇඳුම් | → | සාරි,කලිසම්,කමිස |
| නිවාස | → | මහල් නිවාස,තනි නිවාස,වායුසමීකරණය කළ නිවාස |

03.

ı.

- පාරිභෝගිකයාගේ ප්‍රචාර වලට අවධානය යොමු කිරීම.
- භාණ්ඩ අලෙවි කිරීමේ දී මිල ලැයිස්තු ප්‍රදර්ශනය කිරීම.
- ගුණාත්මක භාණ්ඩ හා සේවා නිෂ්පාදනය හා සැපයීම.
- කිරුම් මිනුම් අක්‍රමිකතා මුළුමනින්ම ඉවත් කිරීම.

ii.

- තම ව්‍යාපාරයට තිබෙන අභියෝග කල් ඇතිව හඳුනා ගත හැක.
- ව්‍යාපාරික අවස්ථා හඳුනාගැනීම හා ඉන් ප්‍රයෝජන ගැනීම.
- ව්‍යාපාරික තර්ජන හඳුනා හඳුනා ගැනීම හා ඒවාට සාර්ථකව මුහුණ දීම.

iii.

- සී / ස සමාගම් 2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ ලියාපදිංචි කිරීම.
- තනි පුද්ගල ව්‍යාපාර 1918 අංක 6 දරන ව්‍යාපාර නාම ආඥා පනත යටතේ ව්‍යාපාර නාමය ලියාපදිංචි කිරීම.
- හවුල් ව්‍යාපාර සඳහා ලිඛිත ගිවිසුමක් නොමැති විට හවුල් ආඥා පනතේ 24 වන වගන්තිය ප්‍රකාරව කටයුතු කිරීම.
- සේවක අර්ථ සාධක අරමුදල නිසි පරිදි ගෙවීම.
- තහනම් කරන ලද අමුද්‍රව්‍ය භාවිතයෙන් වැලකීම.
- පරිසර දූෂණය අවම කිරීම.

iv.

- ආයෝජනය කිරීමට අපේක්ෂිත මුදල් ප්‍රමාණය.
- කාලච්ඡේදය තුළ දී වැය කිරීමට අපේක්ෂිත මුදල.
- අපේක්ෂිත ලාභය.
- ලබාගැනීමට අපේක්ෂිත බැංකු ණය මුදල.

v.

- ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකය.
- පසු ගිය වර්ෂයේ අනුමත මූල්‍ය ප්‍රකාශන / මූල්‍ය වාර්තා.
- ආදායම් බදු ලිපිගොනුව.
- සම්පූර්ණ කරන ලද ණය අයදුම් පත්‍රය.
- ඇපකරුවන් / ඇප දේපල වලට අදාල වාර්තා.

4.)i.

- සහන පොලියට ණය ලබා දීම.
- බදු සහන ලබා දීම.
- ජාත්‍යන්තර ගැනුම්කරුවන් මුණ ගැස්සවීම.
- විවිධ දිරිගැන්වීම් ලබාදීම.

ii.

- අසීමිත වගකීම.
- අඛණ්ඩ පැවැත්මක් නොමැතිවීම.
- නෛතික පුද්ගලභාවයක් නොමැති වීම.
- ලාභය කිහිප දෙනකු අතර බෙදීයාම.

iii.

- ඉහල ප්‍රාග්ධන ශක්තියක් ගොඩනගා ගැනීමට.
- රජයේ විවිධ සහන ලබාගැනීමට.
- ඉහළ සමාජ පිළිගැනීම.
- නෛතික ආරක්ෂාව හා අඛණ්ඩ පැවැත්ම.
- වගකීම සීමා සීමාසහිත වීම.

iv.

- පීසා හට් (Pizza hut)
- මැක්ඩොනල්ඩ් (McDonald's)
- කේ එෆ් සී (KFC)

v.

හවුල් ව්‍යාපාරයකට ලිඛිත හවුල් ගිවිසුමක් නොමැති අවස්ථාවක හවුල් ආඥා පනතේ 24 වන වගන්තියේ කොන්දේසි වලට අනුව කටයුතු කළ යුතුය. එම නියමයන් නම්,


- ප්‍රාග්ධනයට සම සමව දායක විය යුතු අතර, ලාභ අලාභය ද සම සමව බෙදා ගත යුතුය.
- හවුල්කරුවන්ට වැටුප් ලබාගැනීමට හිමිකමක් නැත.
- ප්‍රාග්ධනය සඳහා පොලී ලබාගැනීමට හිමිකමක් නැත.
- ගැනිලි සඳහා පොලී අය නොකෙරේ.
- හවුල්කරුවන් ප්‍රාග්ධනයට අමතරව, ව්‍යාපාරයට සපයන ණය සඳහා 5% ක පොලියක් හවුල් ව්‍යාපාරය විසින් ගෙවිය යුතුයි.

5.

i.

- වෙළෙඳපොළ තරඟකාරීත්වය.
- පාරිභෝගික අවශ්‍යතා හා වුවමනා පිළිබඳව.
- තම ආයෝජන ශක්තිය.
- භෞතික හා මානව සම්පත් සපුරා ගැනීමේ හැකියාව.
- යටිතල පහසුකම් නිසි පරිදි තිබේද යන්න පිළිබඳව.

ii.



iii.

- ඉඩ පහසුකම් අවශ්‍ය ප්‍රමාණයට තිබේද යන්න.
- ප්‍රවාහන  පහසුකම්.
- යටිතල පහසුකම් හා යෙදවුම් ලබා ගැනීමේ පහසුව.
- වෙළඳපලට පිවිසීමේ පහසුව.
- ඉලක්ක වෙළෙඳපොළ ආවරණය වේ ද යන්න පිළිබඳව.

iv.

- ප්‍රායෝගික බව.
- ක්‍රියාත්මක කළ හැකි බව.
- ව්‍යාපාරයට ආර්ථික ප්‍රතිලාභ ලබා ගත හැකි වීම.
- තරහකාරී වාසි ලබාගත හැකිවීම.
- තම අත්දැකීම් හා දැනුමට ගැලපෙන එකක් වීම.

v.

- පාරිභෝගික අවශ්‍යතා හා වුවමනා නොඅඩුව සැපයීම.
- ගුණාත්මක භාණ්ඩ හා සේවා නිෂ්පාදනය හා සැපයීම.
- අලෙවියෙන් පසු සේවාව සැපයීම.
- නීති රීති වලට ගරු  කිරීම හා නිසි පරිදි රජයේ බදු ගෙවීම.
- පාරිභෝගික අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.
- ව්‍යාපාර ආචාරධර්ම වලට ගරු කිරීම හා පිළිපැදීම.

6.

i.

- විනෝදාංශ හා ලැදියා තුළින්
- පුද්ගල දක්ෂතා හා පළපුරුද්ද තුළින්
- වෙළඳපොළ සමීක්ෂණ තුළින්
- අධ්‍යාපනික පාඨමාලා තුළින්.

ii.

- කාන්තාවන් ස්වාධීනව කටයුතු කිරීමට ඇති කැමැත්ත.
- උගත්, ව්‍යාපාරික කාන්තාවන් රට තුල නිර්මාණය වීම.
- කාන්තාවන්ට ආවේණික ව්‍යාපාර අවස්ථා බහුල වීම.
- කාන්තාවන් සඳහා වෙන් වූ යෝජනා ක්‍රම ක්‍රියාත්මක වීම.
- රජයෙන් විවිධ සහන කාන්තා ව්‍යවසායිකාවන්ට හිමිවීම.

iii. එකඟ වේ.

ව්‍යවසායකයින් උත්පත්තියෙන් බිහිවේ. දෙමාපියන් ව්‍යාපාරික කටයුතු වල නිරත වන විට දරුවන් කුඩා කල සිට එම පරිසරයේ හැදී වැඩී ව්‍යාපාරික දැනුම ලබා ගනී. එතුළින් එහි ඇති ශක්තීන්, දුර්වලතා, අවස්ථා හා තර්ජන ඔවුන් නිසි පරිදි වටහා ගනී. ඔවුන්ද පසුව ව්‍යාපාරික කටයුතුවලට ව්‍යවසායකයින් ලෙස සම්බන්ධ වනු ඇත. ඔවුන් දෙමාපියන්ගේ අඩුපාඩුද මගහරවා ගනිමින් ඉතා විධිමත් ව්‍යාපාර බිහි කරයි.

ව්‍යවසායකත්ව දැනුම, ආකල්ප හා කුසලතා පුහුණුව තුළින් ද ජනිත කළ හැක. එවැනි දැනුමක් ලබාදීම තුළින් නව ව්‍යවසායකයින් නිර්මාණය කළ හැක.

iv.

- නව ව්‍යාපෘති ආරම්භ කිරීමට සහන කොන්දේසි මත සේවය ලබාදීම.
- නොමිලේ උපකරණ හා උපදේශන පුහුණුව ලබාදීම.
- දේශීය හා විදේශීය වෙළෙඳපොළ අවස්ථා නිර්මාණය කරදීම.
- බදු සහන ලබා දී ආයෝජකයින් දිරිගැන්වීම.
- ව්‍යවසායකයින් පුහුණු කිරීම.

v.

- වෙළඳපොල තරඟකාරීත්වයේ ස්වාභාවය.
- නව අවස්ථා හා තර්ජන හඳුනාගත හැක.
- පාරිභෝගිකයාගේ අවශ්‍යතා හා වුවමනා කවරේද යන්න.
- රජයේ ආර්ථික ප්‍රතිපත්ති හා අරමුණු පිළිබඳව.

07. (i)

අමල් පෙරේරා ව්‍යාපාරය

2020 වර්ෂයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

| | | |
|---|---|---|
| <u>මුදල් ලැබීම්</u> :- | | |
| ප්‍රාග්ධන ආයෝජනය | | 1,000,000 |
| විකුණුම් | | 1,200,000 |
| ණය ගැති ගැබීම් | | 500,000 |
| බැංකු ණය ලැබීම් | | 800,000 |
| | | 3,500,000 |
| <u>මුදල් ගෙවීම්</u> :- | | |
| පරිපාලන වියදම් | 100,000 | |
| ගැනුම් | 700,000 | |
| බෙදාහැරීමේ වියදම් | 100,000 | |
| මූල්‍ය හා වෙනත් වියදම් | 50,000 | |
| උපකරණ මිලට ගැනීම් | 240,000 | |
| ණය පොලී ගෙවීම් | 60,000 | (1,250,000) |
| මුදල් ප්‍රවාහයේ අතිරික්තය | | 2,250,000 |

ii) මුදල් ශේෂය සෙවීම

**ලැබීම්:-**

| | | |
|---|---|---|
| ප්‍රාග්ධනය | 1,000,000 | |
| බැංකු ණය | 800,000 | |
| විකුණුම් | 1,200,000 | |
| ණයගැති | 500,000 | |
| ලැබීම් | | 3,500,000 |
| | 3,500,000 | |
| ශේෂය ඉ/ගෙ | 2,250,000 | |

**වියදම් (ගෙවීම්):-**

| | | |
|---|---|---|
| ණය වාරික ගෙවීම් | 60,000 | |
| පරිපාලන වියදම් | 100,000 | |
| ගැනුම් | 700,000 | |
| උපකරණ මිලට ගැනුම් | 240,000 | |
| විකිණීමේ හා බෙදා හැරීමේ වියදම් | 100,000 | |
| මූල්‍ය හා වෙනත් වියදම් | 50,000 | (1,250,000) |
| ශේෂය ප/ගෙ | | 2,250,000 |

(iii)

- පහසුවෙන් ආරම්භ කළ හැක.
- ලාභය තනිව භුක්ති විඳිය හැක.
- ව්‍යාපාරික රහස්‍යභාවය ආරක්ෂා වේ.
- ස්වාධීනව තීරණ ගත හැක.
- නෛතික අවශ්‍යතා අවම මට්ටමක පවතී.
- කුඩා ප්‍රාග්ධනයකින් වුවද ඇරඹිය හැක.